www.kidworship.kr

# සොදොම් සහ ගොමොරාව

- 7th Story-



43Page

**පොතේ ගුරා** සොදොම් සහ ගොමොරා නගර දෙකෙහි සිටිය ජනතාව දෙවියන්වහන්සේට විරුද්ධව බොහෝ පව් කළා. මේ නගරවල ජනතාවගේ පාපය කොයිතරම් බරපතල ද කියනවා නම්, මේ නගර ගින්නෙන් විනාශ කරන්න දෙවියන්වහන්සේ තීරණය කළා. ඒ නිසා දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට උන්වහන්සේගේ සැලැස්ම ගැන කතා කළා.

**දෙවියන්වහන්සේ** මම සොදොම් සහ ගොමොරා නගර විනාශ කරනවා.

**පොතේ ගුරා** දෙවියන්වහන්සේගේ සැලැස්ම ආබ්‍රහම් අහපු වෙලාවේ සොදොමේ ජීවත් වූ ඔහුගේ බෑණා වූ ලොත් ගැන ආබ්‍රහම් බොහෝ සේ කරදරයට පත් වුණා. ඒ නිසා ඔහු ඕනෑකමින් යාච්ඤා කළා.

**ආබ්‍රහම්** ස්වාමිනි, සොදොම් සහ ගොමොරාවේ ධර්මිෂ්ට මිනිසුන් 10 ක් ඉන්නවනම්, ඔබවහන්සේ නගරය විනාශ නොකොට ඔවුන් නිසා ඒ නගරයට සමාව දෙනවද ?

**දෙවියන්වහන්සේ** සොදොම් සහ ගොමොරා නගරයේ ධර්මිෂ්ට මිනිසුන් 10 ක් සිටියොත් මම ඒ නගරය විනාශ නොකොට ඔවුන්ට සමාව දෙන්නම්.


---



44Page

**පොතේ ගුරා** නමුත්, සොදොමේ සහ ගොමොරාවේ ධර්මිෂ්ට මිනිසුන් 10 දෙනෙක්වත් සිටියේ නෑ. දෙවියන්වහන්සේ සොදොම් සහ ගොමොරාව විනාශ කරන්න සැලසුම් කරලා තිබුණත් එහි සිටින ලොත් සහ ඔහුගේ පවුල ගළවා ගැනීමකුත් උන්වහන්සේට තිබුණා. දවසක් දේවදූතයන් රාත්‍රී ආහාරයකට මෙන් ලොත්ගේ නිවසට පැමිණෙනවා. ඔවුන් දේවදූතයන් බව දැනගත් ලොත් ඔවුන්ව නිවස ඇතුළට ආරාධනා කොට ඔවුන්ට රාත්‍රී කෑම පිළිගන්වනවා. ඔවුන් කෑම කා අවසන් වූවාට පසුව සොදොම් නගරයේ සෑම පැත්තෙන්ම ආපු මිනිස්සු ලොත්ගේ නිවස වට කරලා ලොත්ගේ ගේ ඇතුලේ සිටින ආගන්තුක මිනිසුන් දෙදෙනාව පිටතට දෙන්න කියා ඉල්ලනවා.

---



45Page

**ලොත්** නෑ. මගේ මිත්‍රවරුනි, මෙයාලා මගේ විශේෂ අමුත්තෝ.

**පොතේ ගුරා** ලොත් කොපමණ මේ මිනිස්සු නතර කරන්න හැදුවත් එයින් කිසි ඵලක් වුණේ නෑ. එවිට දේවදූතයන් ලොත්ව ගේ ඇතුළට ඇදගෙන දොර තදින් වැසුවා. තවද දේවදූතයන් ගෙහි දොර ළඟ සිටි ලොකු කුඩා සියල්ලෝම අන්ධ කළා. ඒ නිසා ඔවුන්ට දොර හොයාගන්නට අමාරු වුණා. දේවදූතයන් ලොත්ට කතා කරලා මෙහෙම කියනවා.

**දේවදූතයා** මේ නගරයේ මිනිස්සු දෙවියන්වහන්සේට විරුද්ධව බරපතලව පව් කර තිබෙන නිසා, උන්වහන්සේ අපිව එව්වේ මේ නගරය විනාශ කරන්න.

**ලොත්** ඕ...ඕහ්...ඕහ්. ඒක ඇත්තක් ද?

**දේවදූතයා** ඉක්මන් කරන්න. ඔයාගේ භාර්යාව සහ ඔයාගේ දුවරු දෙදෙනා අරගෙන ඉක්මනින් සොදොම් වලින් පිටත් වෙන්න.


46Page

**පොතේ ගුරා** දෙවියන්වහන්සේ සොදොමේ නුවරවල් අනිවාර්යයෙන්ම විනාශ කරන්න හිතාගෙනයි හිටියේ. එහෙත් ආබ්‍රහම් සිහි කරලා ලොත් විසූ නුවරවල් විනාශ කරද්දී ඒ විනාශය මධ්‍යයේම ලොත් සහ ඔහුගේ පවුල පිටතට යැවුවා. මේ වෙලාවේ දේවදූතයන් ලොත්ට අවසාන මගපෙන්වීම ලබා දෙනවා.

..........................................................................................



47Page

**දේවදූතයා** පිටුපස බලන්න එපා. මේ සමභූමියේ කොහේවත් නතර වෙන්න එපා. නුඹ නාස්ති නොවන පණිස මේ නගරය අතහැරලා කඳුවලට දුවන්න.

**ලොත්** අනේ මගේ ස්වාමීනි ! එසේ නොවේවා !
මේ ළඟ තියෙන කුඩා නගරයක් වන ශොවර් වෙතට පැනලා යන්න මට ඉඩ දෙනන්.

**පොතේ ගුරා** ලොත් දේවදූතයන්ගෙන් එසේ ඇසුවා.


..........................................................................................


48Page


49Page

**පොතේ ගුරා** ලොත්, ශොවර් නුවරට ළඟා වෙද්දී පොළොව පිට ඉර උදා වී තිබුණා. දෙවියන්වහන්සේ සොදොම් සහ ගොමොරා පිට වැස්සක් මෙන් අහසෙන් ගිනි සහ ගෙන්දගම් එවා ඒ නුවරවල් ද, මුළු සමභූමිය ද, ඒ නුවරවල සියලු වැසියන්ද, භූමියේ හටගත් සියලු දේද විනාශ කළා. දෙවියන්වහන්සේ දේවදූතයන් තුළින් “ ආපසු හැරී නොබලන්න ” කියා දුන් මග පෙන්වීම නොසළකා හැරිය ලොත්ගේ භාර්යාව පිටි පස හැරී බලපු නිසා ඇය එතැනම ලුණු කණුවක් වූවාය.

..........................................................................................


50Page

**ජීවිතයට අදාල කිරීම** දුවේ පුතේ, පාපයට වරදට හැමදාමත් පවතින්න බෑ. ඒවාට දඬුවම් පැමිණෙනවා. ඒ නිසා ඔයාගේ ජීවිතේත’වරදවල් තියෙනවා නම් ඒවා දෙවියන්වහන්සේට කියන්න. පාපයට සමාව අයදින්න. එසේ වුණොත් දෙවියන්වහන්සේ ඔබට සමාව දෙන සේක.